www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ රැස්වීම: වතු කම්කරු අරගලයේ පාඩම්

## Sri Lankan public meeting: Lessons of the plantation workers’ struggle

2009 නොවැම්බර් 05

වතු කම්කරු අරගලයේ දේශපාලන පාඩම් සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර දිස්ත්‍රික්කයේ ආගර පතන දී නොවැම්බර් 15 දින සමාජවාදී සමානතා පක්ෂය සහ බැල්මොරල් ක්‍රියාකාරී කමිටුව විසින් ඒකාබද්ධ රැස්වීමක් පැවැත්වීමට නියමිත ය.

වෘත්තීය සමිති විසින් වතු කම්කරුවන් මත වැටුප් අරගලය පාවාදීමේ ගිවිසුම පැටවීමට ප්‍රතිචාර වශයෙන් ආගරපතන බැල්මොරල් වත්තේ කම්කරුවෝ සැප්තැම්බර් මාසයේ මැද භාගයේ දී ස්වාධීන කම්කරු ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා ගත්හ. සාමූහික ගිවිසුම මගින් තවත් වසර දෙකක් සඳහා කම්කරුවන් දරිද්‍රතා මට්ටමේ වැටුපකට සහ රුදුරු වැඩ ඉලක්කවලට බැඳ තබනු ඇත.

ගිවිසුමට විරුද්ධ යයි ප්‍රකාශ කරන ලද වෘත්තීය සමිති ද ඇතුලුව සියලුම වෘත්තීය සමිති වතු කම්කරුවන් විසින් ආරම්භ කරනු ලබන කවර හෝ ස්වාධීන අරගලයක් මර්දනය කිරීමේ තැතක යෙදී සිටින බවට බැල්මොරල් ක්‍රියාකාරී කමිටුව විසින් සියලුම කම්කරුවන් වෙත නිකුත්කරන ලද ආයාචනයකදී අනතුරු අඟවන ලදී. මසකට පසුව එම අනතුරු ඇඟවීමේ නිරවද්‍ය භාවය සනාථවිය. ඔක්තෝබර් 17 දා දීපවාලී උත්සවය පසුවන තුරු කිසිදු අරගලයක් කිරීම ප්‍රමාද කල "විරුද්ධ පාර්ශවයේ" වෘත්තීය සමිති වෙනස් කල නොහැකි කාරනයක් ලෙස සලකා දැන් ගිවිසුම පිලිගෙන ඇත.

දිවයින පුරාම කම්කරුවෝ එකම ප්‍රශ්නයට මුහුන දෙති. කම්කරු පන්තිය මත ධනවාදයේ ආර්ථික අර්බුදයේ ව්‍යසනයන් පැටවීමේ දී වෘත්තීය සමිති හාම්පුතුන්ගේ සහ ආන්ඩුවේ කාර්මික පොලිස්කරයෝ ලෙස ක්‍රියාත්මක වෙති. වැඩකරන ජනතාවට මෙම දඬුඅඬුවෙන් මිදියහැකි වන්නේ වගකීම තමන්ගේ ම අතට ගැනීමෙන් සහ අතලොස්සක් ධනවතුන්ගේ ලාබ වෙනුවට සමාජයේ බහුතරයේ දැවෙන අවශ්‍යතාවයන් සන්තර්පනය කිරීම සඳහා සමාජය ප්‍රතිසංවිධානය කිරීමේ සමාජවාදී ඉදිරි දර්ශනයක් මත පදනම් වූ දේශපාලන අරගලයක් දියත් කිරීමෙන් පමනි.

රැස්වීමේ කථිකයෝ කම්කරු පන්තියේ මූලෝපායාත්මක අත්දැකීම් සමාලෝචනය කරමින් කම්කරුවන්ගේ අයිතීන් සහ ජීවන තත්ත්වයන් රැක ගැනීමට අවශ්‍ය සමාජවාදී මූලෝපාය විස්තාරනය කරනු ඇත. රැස්වීමට සහභාගි වන ලෙස සියලුම කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

**ස්ථානය: හෝල්බෲක් පිටිය, ආගරපතන.**

**දිනය සහ වේලාව: නොවැම්බර් 15 ඉරිදා, උදේ 11.00ට**

© www.wsws.org